
John Keells Group

# JK පුවත්

2021/22 3 වන කාර්තුව | 2021 ජූලි, අගෝස්තු සහ සැප්තැම්බර් පුවත්









# සමූහාධිපතිතුමාගේ පණිවුඩය

2021 ජුනි 30 වෙනි දිනෙන් අවසන් මාස 03 සඳහා පිළියෙළ කළ JKH කාර්තුමය මූල්‍ය ප්‍රකාශනවලින් උපුටා ගන්නා ලදි.



**ක්‍රිෂාන් බාලේන්ද්‍ර**
සභාපති

- විමර්ශන කාර්තුව තුළදී සමූහයේ EBITDA සැලකිය යුතු වැඩිවීමක් සමග රුපියල් බිලියන 4.76 ක් වාර්තා කරන ලදි.
- පාරිභෝගික ආහාර හැර සමූහයේ ව්‍යාපාර පෙර වර්ෂයේ පළමු කාර්තුවට සාපේක්ෂව ලාභදායකත්වයේ වැඩිවීමක් වාර්තා කරන ලදි.
- 'සිනමන් ලයිෆ්' හී නේවාසික මහල් නිවාස ඒකක භාරදීමේ කටයුතු ආරම්භ කළ බැවින් ව්‍යාපෘතියෙන් පළමුවරට ආදායම් සහ ලාභය වාර්තා විය.
- සමූහයේ වරාය ව්‍යාපාරය වන SAGT පසුගිය මූල්‍ය වර්ෂයේ මෙම කාලපරිච්ඡේදයට සාපේක්ෂව පරිමාවේ ඉලක්කම් දෙකක වර්ධනයක් සමගින් ලාභදායිත්වයේ වැඩිවීමක් වාර්තා කරන ලදි.
- කොළඹ වරායේ බටහිර බහාලුම් පර්යන්තය සංවර්ධනය කිරීම සහ මෙහෙයවීම සඳහා අභිප්‍රාය ලිපිය ක්‍රියාත්මක කිරීම පමණක් නොව එම ලිපියේ ඇතුළත් කොන්දේසිවලට අනුකූලව සියළු කටයුතු සාර්ථකව සිදුවෙමින් පවතී.
- සුපිරිවෙළෙඳසැල් ව්‍යාපාරයේ කාර්තුවෙන් කාර්තුව අලෙවිය අඛණ්ඩව නැවත වර්ධනය වූ අතර කොවිඩ්-19 තෙවනි රැල්ල ඇති වීමට පෙර අලෙවියේ ඉලක්කම් දෙකක වර්ධනයක් වාර්තා කරන ලදි.
- ජංගම දුරකථන අංශයේ පරිමාවේ ඉලක්කම් 03 ක වර්ධනයක් සමග ඔෆීස් ඔටෝමේෂන් ව්‍යාපාරය ලාභදායිත්වයේ ඉහළ වර්ධනයක් වාර්තා කරන ලදි.
- බීම, ශීතකළ රස ආහාර සහ පහසු ආහාර යන අංශ තුනම පරිමාණයේ ඉලක්කම් දෙකක වර්ධනයක් වාර්තා කරමින් හොඳ ප්‍රතිසාධන වේගයක් පෙන්නුම් කරන ලදි.
- මාලදිවයින පිහිටි අපගේ නිවාඩු නිකේතන හි ප්‍රකෘතිභාවය තව දුරටත් පවත්වාගෙන යාමට හැකි වුයේ, අපේක්ෂිත මට්ටමට වඩා වැඩි සංචාරකයින් පැමිණීමේ ප්‍රවනතාවක් පෙන්වූ බැවිනි.
- ලාභාන්තිකය කෙරේ ඇති වූ බලපෑම නොසළකා ශක්තිමත් ණය වර්ධනය සහ අවම අපහායන වෙන්කිරීම් නිසා නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පීඑල්සී සිය ලාභදායිත්වයේ වර්ධනයක් වාර්තා කරන ලදි. සියළුම චැනල්වල වර්ධනයක් සමගින් යූනියන් ඇෂුවරන්ස් පීඑල්සී ලාභදායිත්වයේ වර්ධනයක් වාර්තා කරන ලදි.
- රුපියල් මිලියනයක ආදායම සඳහා වූ සමූහයේ කාබන් නිකුතුව 21% ක අඩුවීමක් සමග මෙට්‍රික් ටොන් 0.59 ක් වූ අතර රුපියල් මිලියනයක ආදායම සඳහා ජල භාවිතය 34% අඩුවීමක් සමග කියුබික් මීටර් 12.10 ක් විය.

| ප්‍රත්‍යාවර්ති EBITDA * (රු.'000) | ජුනි 30 අවසන් කාර්තුව | | |
|---|---|---|---|
| | Q1 2020/21 | Q1 2021/22 | % |
| ප්‍රවාහන | 1,023,326 | 394,743 | 159 |
| පාරිභෝගික ආහාර | 317,682 | 487,149 | (35) |
| රිටේල් | 1,562,792 | 501,851 | 211 |
| සංචාරක | (648,773) | (1,461,187) | 56 |
| දේපල | 542,404 | (28,881) | 1,578 |
| මූල්‍ය සේවා | 769,679 | 536,726 | 43 |

* EBITDA තුළ පොලී ආදායම සහ බදු පසු ලාභ කොටස පදනම් කර ගත් හිමිකම් ආයෝජන කොටස ඇතුළත් නමුත් ව්‍යාපාරයේ සාමාන්‍ය මුදල් මෙහෙයුම් ක්‍රියාකාරිත්වය නිරූපණය කිරීම සඳහා විදේශ විනිමය ණය සහ මුදල් මත ඇති වූ විනිමය පාඩු සහ ලාභවල බලපෑම ඉවත් කර ඇත.

# සම්මාන සහ පිළිගැනීම්

අඛණ්ඩව 16 වෙනි වරට 2021 අගෝස්තු 03 වෙනි දා LMD විසින් නිකුත් කළ ශ්‍රී ලංකාවේ වඩාත් ගෞරවාන්විත ව්‍යාපාර ආයතන ලැයිස්තුවේ පළමුවන ස්ථානයට පත් වෙමින් ජෝන් කීල්ස් හෝල්ඩින්ග්ස් පීඑල්සී වාර්තාවක් තබන ලදි. එපමණක් නොව JKH පළමු ස්ථානයට පත් වන ලද්දේ එම ලැයිස්තුකරණය සඳහා සළකා බලන අංශ 12 වන මූල්‍ය ක්‍රියාකාරිත්වය, ගුණාත්වය පිළිබද දැනීම, කළමණාකරණය, අවංකබව, නව්‍යතාවය, ගතිකබව, ආයතනික සංස්කෘතිය, CSR සහ තිරසාරත්වය, දැක්ම, ජාතික දැක්ම, මානව සම්පත් සහ පුද්ගල කළමනාකරණය සහ අර්බුද කළමනාකරණය යන සියළුම අංශවලින් පළමු ස්ථානයට පත් වෙමිණි.




2021 අගෝස්තු 16 වෙනි දා පැවති ඉන්ෂුරන්ස් ඒෂියා සම්මාන උළෙලේ දී යූනියන් ඇෂුවරන්ස් පීඑල්සී (UA) 2021 වසරේ ශ්‍රී ලංකාවේ හොදම දේශීය ජීවිත රක්ෂක සහ UA හී ඩිජිටල් ජීවිත රක්ෂණය වන 'කිල්ක්ලයිෆ්' වසරේ නව රක්ෂණ සේවාව ලෙස නම් කරන ලදි. UA සිය ව්‍යාපාරය කෙරේ ලැදි පාර්ශ්ව සඳහා විශිෂ්ට වටිනාමකමක් ලබාදිමෙහිලා දරන උත්සහාය ඉන්ෂුරන්ස් ඒෂියා හී පිළිගැනීමට ලක් විය.




2021 සැප්තැම්බර් 08 වෙනි දා පැවති පැසිපික් ආසියානු සංචාරක සංගමයේ ස්වර්ණ සම්මාන උළෙලේ දී 'Cinnamon Travel Pledge' වැඩසටහන වෙනුවෙන් තිරසාරත්වය සහ සමාජ වගකීම කාණ්ඩය යටතේ PATA Grand සම්මානය සිනමන් හොටෙල්ස් ඇන්ඩ් රිසෝට්ස් වෙත පිරිනමන ලදි. මෙම වසරේ සම්මාන උළෙලේ දී සම්මාන දිනා ගත් එකම ශ්‍රී ලාංකික සමාගම වනුයේ සිනමන් ය.






ශ්‍රී ලංකාවේ දැනට 9 වෙනි ස්ථානය දිනා ගෙන ඇති යූනියන් ඇෂුවරන්ස් Great Place to Work®, විසින් නම් කළ 2021 වසරේ ආසියාවේ හොදම සේවා ස්ථාන (විශාල සමාගම් කාණ්ඩයේ) අතරින් 70 වෙනි ස්ථානය දිනා ගෙන ඇත. මෙම ගෞරවනාමය 2021 ජුලි 20 වෙනි දා පිරිනැමූ අතර සම්මාන උළෙල පවත්වන ලද්දේ 2021 අගෝස්තු 10 වෙනි දාය.



ආයතනික සමාජ වගකීම්

## ජෝන් කීල්ස් ඉංග්‍රීසි භාෂා ශිෂ්‍යත්වලාභීන් පළමු ඔන්ලයින් කථික තරඟාවලියේ දී දස්කම් දක්වයි.


2021 ජුනි සහ ජුලි මාසයන්හීදී JKF, ගේට්වේ භාෂා මධ්‍යස්ථානය සමග එක්ව English for Teens දෙවෙනි මට්ටමේ සිසුන් සඳහා සංවිධානය කළ පළමු ඔන්ලයින් ඉංග්‍රීසි භාෂා කථික තරගාවලියේ ස්ථානීය ප්‍රාථමික තරගවට සඳහා ශිෂ්‍යත්වලාභීන් 134 දෙනෙකු සහභාගී වන ලදි. මෙම ප්‍රාථමික තරඟවට විනිශ්චය කරන ලද්දේ ඉමානි පෙරේරා, ඉනීෂා පෙරේරා, දෙස්රී ක්‍රූස්, කනිශ්ක හේරත්, රසල් වැලන්ටයින් සහ විෂාන්ත් විජේසිංහ යන ස්වෙච්ඡා සේවකයින් විසින් ය.

ශිෂ්‍යත්වලාභීන් 134 න් නුවර, රාජාවැල්ල, රත්මලාන, බේරුවල, ගාල්ල, සූරියවැව, ත්‍රිකුණාමලය, වවුනියාව සහ කොළඹ ප්‍රදේශයන් නියෝජනය කරමින් අවසාන තරඟකරුවන් 12 දෙනෙකු ''කොවිඩ්-19 වසංගත කාලය තුළ මගේ අත්දැකීම්'' යන තේමාව ඔස්සේ අවසාන කථික තරගාවලිය සඳහා තෝරා ගන්නා ලදි. 2021 අගෝස්තු 17 වෙනි දා පැවැත් වූ අවසාන තරඟාවලිය විනිශ්චය සඳහා JKF හී මෙහෙයුම් ප්‍රධානී කාමලීන් ජයසූරිය මහත්මිය සහ සිනමන් රෙඩ් හී සාමාන්‍යාධිකාරී ටෙරන්ස් ප්‍රනාන්දු මහතා සහභාගී වූ අතර තරඟකරුවන්ගේ උත්සහාය සහ ප්‍රමිතිය ඇගයීමට ලක් කරන ලදි.


කථික තරඟයේ ප්‍රථම ස්ථානය ගාල්ලේ ශිෂ්‍යත්වලාභියෙකු දිනා ගත් අතර රත්මලාන සහ කොළඹ ප්‍රදේශයේ ශිෂ්‍යත්වලාභීන් පිළිවෙලින් දෙවෙනි සහ තෙවෙනි ස්ථාන දිනා ගන්නා ලදි. ජයග්‍රාහකයින් සියළුදෙනාටම ඔවුන්ගේ අධ්‍යාපන අවශ්‍යතාවයන් සඳහා භාවිත කළ හැකි පොත් මිලදී ගැනීමට ත්‍යාග සහතිකපත්‍ර ලබා දෙන ලදි.

## ජෝන් කීල්ස් පදනම, රෝහල්වලට කොවිඩ්-19 වසංගතයට මුහුණ දීමට අත්‍යාවශ්‍ය උපකරණ පරිත්‍යාග කරන ලදි.



ජෝන් කීල්ස් පදනම මුලතිව්හී පුතුකුදියිරුප්පු ප්‍රාදේශීය රෝහලේ නව කොවිඩ් ප්‍රතිකාර ඒකකය සඳහා රුපියල් 275,000 ක් වටිනා මල්ටිපැරා මොනිටරයක් පරිත්‍යාග කරමින් චයිල්ඩ්ෆන්ඩ් විසින් සංවිධානය කළ 'Sri Lanka Gives Back' වැඩසටහනට හවුල් වන ලදි. මෙම හවුල්කාරිත්වය ඇති වූයේ JKF මෑත දී අවසන් කළ වසර හතක මුලතිව් ග්‍රාම සංවර්ධන ව්‍යාපෘතියෙන් පසුවය. යූනියන් ඇෂුවරන්ස්හී ප්‍රාදේශීය විකුණුම් කළමනාකරු ආර්රස තුෂ්යන්තන් මහතාගේ සහාය ඇතිව මෙම උපකරණය 2021 අගෝස්තු 10 වෙනි දින රෝහලට භාර දෙන ලදි.

රනාල ජෝන් කීල්ස් ප්‍රජා ශක්ති වැඩසටහනේ එක් පියවරක් ලෙස JKF, සිලෝන් කෝල්ඩ් ස්ටෝර්ස් සමග හවුල්ව දැනට කොවිඩ් ප්‍රතිකාර රෝහලක් ලෙස ක්‍රියාත්මක වන නවගමුව ප්‍රාදේශීය රෝහලේ දැඩි අධීක්ෂණ ඒකකයේ ඇඳන් 05 ක් සඳහා රුපියල් 455,685 ක් වටිනා බිත්ති ඔක්සිජන් පද්ධති සමග ඇඳන් ඉහළ සවිකළ හැකි ඔක්සිජන් ප්‍රවාහ රෙගුලේටර් පරිත්‍යාග කරන ලදි. මෙම උපකරණ 2021 අගෝස්තු මස 22 වෙනි දා භාර දෙන ලදි.




## ජෝන් කීල්ස් ප්‍රජා ශක්ති ව්‍යාපෘතිය හරහා කාන්තා ව්‍යවසායන් ශක්තිමත් කරයි.


කාන්තාවන් සවිබලගැන්වීමෙහිලා ජෝන් කීල්ස් පදනම දරන උත්සහාය තවත් වර්ධනය කරමින් කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහ සිලෝන් කෝල්ඩ් ස්ටෝර්ස් ව්‍යාපෘති කණ්ඩායමේ ඉල්ලීම මත, ජෝන් කීල්ස් ප්‍රජා ශක්ති ව්‍යාපෘතිය යටතේ 2021 ජුලි 21 වෙනි දා රනාල බටේවෙල රන්ලිය කාන්තා සමාජයේ සමාජිකයින් 15 දෙනෙකු සඳහා පුද්ගල ඵලදායීතා වැඩසටහනක් සංවිධානය කරන ලදි. චරිත් ද සිල්වා, නදීෂා නිර්මල සහ මධුෂා විජේරත්න ස්වෙච්ඡා සේවකයින් විසින් මෙම ඔන්ලයින් වැඩසටහන මෙහෙය වූ අතර ව්‍යවසායකත්වය, හොඳ පාරිභෝගික සේවාව, SWOT සහ අනාගත අවස්ථා හඳුනාගන්නේ කෙසේ ද යන්න පිළිබඳ දැනුම ලබා දෙමින් කාන්තාවන් දැනුමෙන් සවිබලගන්වන ලදි.




## ජෝන් කීල්ස් පදනම, කීල්ස් සමග හවුල්ව SKIP වැඩසටහන (අභිවෘද්ධියට කුසළතාවයන්) හරහා සමූහයේ සැපයුම්කරුවන්ගේ කුසළතාවයන් වර්ධනය කරයි.

කීල්ස් සැපයුම්කරුවන් සඳහා ක්‍රියාත්මක කළ 'Skill into Progress' (SKIP) වැඩසටහන 2021 ජුලි මස 15 වෙනි දා පැවැත් වූ ඔන්ලයින් වැඩසටහන සමග නිමා වූ අතර සහභාගීවූවන් 11 දෙනෙකු සාර්ථකව අවසාන විභාගය සමත් වන ලදි. පසුගිය SKIP වැඩසටහන් මෙන්ම මෙම වැඩසටහන ද පැය 36 ක් පුරා පැවැත්වුණු අතර ඉදිරිපත්කිරීමේ කුසළතාවයන්, ගනුදෙනු කතිකා කර ගැනීමේ කුසලතාවයන්, සහ ඊමේල් ආචාරධර්ම යනාදි තේමාවන් ආවරණය කරමින් සැපයුම්කරුවන්ගේ අවශ්‍යතාවයන්ට අනුකූලව මෙහෙයවන ලදි.

ජෝන් කීල්ස් පදනම විසින් මෙහෙයවන SKIP වැඩසටහනේ අරමුණ වනුයේ ජෝන් කීල්ස් සමූහය තුළ ක්‍රියාත්මක වන සැපයුම්දාමයන්හී හඳුනාගත් පාර්ශ්වයන්ගේ කුසළතාවයන් වැඩිදියුණු කිරීමට සහාය වීමය. ගේට්වේ භාෂා මධ්‍යස්ථානය විසින් ක්‍රියාත්මක කළ මෙම වැඩසටහන සැපයුම්කරුවන්ගේ කුසළතාවයන්හි අඩුපාඩු මගහරවා ගැනීමට සහාය වෙමින් ඔවුන්ගේ සේවා ගුණාත්වය ඉහළ නංවමින් පවත්නා වසංගත කාලයෙන් පසුව ඔවුන්ගේ ආදායම ඉහළ නංවාගැනීමට උදව් කරයි.






**කාන්තාවන් කේන්ද්‍ර කොටගත් පුහුණුව,** සේවක පිරිස තුළ කාන්තා සහභාගිත්වය වැඩිකිරීමේ අරමුණ ඇතිව ONE JKH ක්‍රියාකාරකම් යටතේ අවධානය යොමු කරන එක් අංගයකි. මේ සදහා සහාය දක්වමින් ජෝන් කීල්ස් සමූහයේ කාන්තා සේවකයින් උද්යෝගිමත් කිරීම සහ දැනුවත් කිරීම සදහා 2021 ජුලි 28 වෙනි දා WOICE නමින් කාන්තා කේන්ද්‍රීය අධ්‍යයන වැඩසටහනක් දියත් කරන ලදි. මෙම වැඩසටහන සදහා සහභාගීවූවන්ට ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ ව්‍යවසායිකාවක් වන ඔටාරා ගුණවර්ධන මහත්මියට සවන් දී ඇය ඉතාමත් ඉහළ පිළිගැනීමකට ලක්වුණු සන්නාමයක් ගොඩනැගුවේ කෙසේ ද?, ඇයගේ උද්යෝගය පවත්වාගෙන යාමට ඇයගේ ශක්තීන් සහාය වූයේ කෙසේ ද? සහ අරමුණු ළගා කර ගැනීමට තිබූ කැපවීම සහ නව්‍ය ආකාරයට කටයුතු කිරීම ඇයගේ වෘත්තීය ජීවිතයට මෙන්ම පෞද්ගලික ජීවිතයට සහාය වුණේ කෙසේ ද? යනාදි මාතෘකා පිළිබදව දැනුවත් වීමේ අවස්ථාව උදා විය. මෙම වැඩසටහනේ පටිගතකළ පිටපත සමූහයේ L&D චැනලයේ MS Stream හරහා නැරඹිය හැකි ය.



සේවය කරන දෙමාපියන්ට සහාය වෙමින් මාතෘ නිවාඩු සහ පිතෘ නිවාඩුවලින් පසුව නැවත සේවයට වාර්තා කිරීමේ අනුපාතය වැඩිකිරීම සදහා **සේවායෝජකයාගේ සහාය මත ක්‍රියාත්මක වන ළමා සුරැකුම් සේවාවක්** හඳුන්වාදීම ONE JKH ක්‍රියාකාරකම් යටතේ අවධානය යොමු කරන එක් අංගයකි. සමූහයේ සේවකයින් සදහා "Parents Connect" ජෝන් කීල්ස් සමූහයේ දෙමාපිය ජාලය දියත් කරන ලදි. එපමණක් නොව Parents Connect හරහා ශ්‍රී ලංකා සෞඛ්‍යය අමාත්‍යංශයේ පවුල් සෞඛ්‍යය කාර්යාංශයේ ළමා සුරැකුම්, සංවර්ධන සහ විශේෂ අවශ්‍යතා, ජාතික වැඩසටහන් කළමනාකරු, උපදේශක ප්‍රජා වෛද්‍ය, වෛද්‍ය ආසිරි හේවාමාලගේ විසින් "කොවිඩ්-19 වසංගතය හමුවේ, දෙමාපියන් හට ඇතිවන අභියෝග ජයගැනීම" යන තේමාව ඔස්සේ ඔන්ලයින් දේශන දෙකක් මෙහෙයවන ලදි. පළමු සැසිය 2021 ජුලි 29 වෙනි දා වයස අවුරුදු 13ට වැඩි ළමුන්ගේ දෙමාපියන් සදහා පැවැත් වූ අතර දෙවෙනි සැසිය 2021 අගෝස්තු 04 වෙනි දා වයස අවුරුදු 13ට අඩු ළමුන්ගේ දෙමාපියන් සදහා පවත්වන ලදි.




ජෝන් කීල්ස් සමූහය, 2015 සිට සියළුම සේවක ප්‍රතිපත්තීන්ට "ලිංගික හැඩගැස්ම" සහ "ලිංගික අනන්‍යතාවය" යන සංකල්ප ඇතුළත් කර පළමු ශ්‍රී ලාංකික සමාගම ලෙස නම් දරමින්, 2015 සහ 2016 තුළ සමාන අයිතිවාසිකම් යටතේ සමූහය පුරා දැනුවත් කිරීමේ සැසි දියත් කරමින් සේවක මණ්ඩලය LGBTIQ ප්‍රජාව දෙසට වඩාත් අනුගත කිරීමේ උත්සහායක නිරත වූ අතර ජෝන් කීල්ස් සමූහය සංක්‍රාන්ති පුද්ගලයෙකු පාරිභෝගික සේවා විධායක මට්ටම සදහා බදවා ගත් ශ්‍රී ලංකාවේ පළමු ව්‍යාපාරික ආයතනය වේ. අපගේ සේවා ස්ථානය සංක්‍රාන්ති ප්‍රජාවට වඩාත් අනුකූල කිරීම සදහා සේවක සමීක්ෂණයක් පැවැත්වීම සදහා සමූහය ජාතික සංක්‍රාන්ති ජාලය සහ The Grassrooted Trust සමග හවුල්කාරීත්වයක් ඇති කර ගන්නා ලදි. සමූහය සදහා ත්‍රෛභාෂා ඔන්ලයින් ප්‍රශ්නාවලියක් සහිත සමීක්ෂණයක් පළමු අදියර ලෙස ද විධායක සහ විධායක නොවන සේවකයින් සහභාගී කරවාගෙන ත්‍රෛභාෂා කණ්ඩායම් සමීක්ෂණයක් දෙවෙනි අදියර කොටස් දෙකකින් පැවැත් වූ මෙම සමීක්ෂණය 2021 ජුලි 22 වෙනි දා අවසන් කරන ලදි. සමීක්ෂණයේ සොයාගැනීම් සමග LGBTIQ ප්‍රජාවේ ප්‍රධාන පුද්ගලයින් සමග පැවැත් වූ සම්මුඛ පරීක්ෂණවලින් ලබා ගත් තොරතුරු සමගින් සංක්‍රාන්ති ප්‍රජාවට වඩා යහපත් රැකියා අවස්ථා ලබා දීම සදහා ශ්‍රී ලංකා සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින්ගේ ජාලය විසින් පාර්ලිමේන්තු පනතක් සැලසුම් කරන ලදි.




2021 ජුනි මස දියත් කළ නියමු සැසියේ සාර්ථකත්වයත් සමග ජුලි සහ අගෝස්තු මාසයන්හී ONE JKH ක්‍රියාකාරකම් යටතේ සමූහයේ සහකාර උපසභාපති සිට ඉහළ තනතුරු දරන කණ්ඩායම සඳහා අචේතනික නැඹුරුතාවයන් පිළිබඳව ඔන්ලයින් සාකච්ඡාවක් මෙහෙයවන ලදි. NTB සහ HSBC බැංකු හරහා ශ්‍රී ලංකාවේ ව්‍යාපාර අංශය සහ ඊට අමතරව The Centre for Inclusive Leadership (UK), Bridge Partnership (UK, USA, APAC), සහ Kinetik Solutions (UK), යනාදි පුහුණු ආයතන හා සම්බන්ධව ක්‍රියා කරන කේෂිණී ජයවර්ධන මෙම සාකච්ඡා මෙහෙයවූ අතර එමගින් සේවා ස්ථානයේ පවතින විවිධ අචේතනික නැඹුරුතා, විවිධ අචේතනික නැඹුරුතාවයන් හඳුනාගැනීමට සහ ඒවාට මුහුණ දීමට සහභාගිකයන්ට සහාය වීම යනාදිය කෙරේ අවධානය යොමු කරන ලදි. සෑම සැසියක්ම අවසන් වූයේ සහභාගීවූවන් අචේතනික නැඹුරුතාවයන් කෙරේ අවධානය යොමු කිරීමට කැපවීමත් සමග ය. 2021 ජුලි මාසයේ සිට මාසික ත්‍රෛභාෂා DE&I පණිවුඩය වන "U&I for DE&I" හරහා සමූහයේ සේවකයින් සියළුදෙනාම අචේතනික නැඹුරුතාවයන් පිටුදැකීම පිළිබඳව දැනුවත් කිරීම ආරම්භ කරන ලදි.





ජෝන් කීල්ස් සමූහය විසින් 2021 සැප්තැම්බර් 28 දින කුඩා දරුවන් සිටින අපගේ දෙමාපියන්ට සහය වීම සඳහා **සේවායෝජක ආධාරක ළමා ආරක්ෂක (crèche)** පහසුකමක් හඳුන්වා දෙන ලදී. සේවායෝජක සහයෝගය ඇති ළමා රැකවරණය, සමූහයේ විවිධත්වය, සමානාත්මතාවය සහ අන්තර්කරණය සඳහා ප්‍රධානව අවධානය යොමු කළ යුතු වන අතර, එය මාතෘ හා පීතෘ නිවාඩු වලින් පසු ආපසු සේවයට වාර්තා කිරීමේ ක්‍රියාවලිය පහසු කිරීමේ සහ සේවයෙහි නිරත වන දෙමාපියන්ගේ නොපැමිණීම අඩු කිරීමට සහ අපේ ශ්‍රම බලකායේ කාන්තාවන් වැඩි කිරීමට ගත් පියවරකි.

## ප්‍රතිපත්ති යාවත්කාලීන කිරීම

පැමිණිලිකිරීමේ ක්‍රමයන් වැඩි කිරීම සදහා සමූහයේ ලිංගික හිංසනයට එරෙහි ප්‍රතිපත්තිය 2021 අගෝස්තු මස යාවත්කාලීන කරන ලදි. ඔවුන්ගේ අදාල සුපරීක්ෂක මානව සම්පත් ප්‍රධානීන්ට, සමූහයේ ලිංගික හිංසන විමර්ශන කමිටුව, "සමූහාදිපතිතුමාට සෘජුව" හෝ ඔම්බුඩ්ස්මන්වරයාට දැනුම්දීම යනාදී, දැනට පවත්නා විධිමත් විකල්පවලට අමතරව සේවකයින්ට දැන් ලිංගික හිංසනයක් හෝ හිරිහැර සම්බන්ධයෙන් පහත සදහන් පුද්ගලයින්ට පැමිණිලි කළ හැකි ය.


| නම | තනතුර සහ ව්‍යාපාර ඒකකය |
|---|---|
| සුනෙත් ජයමාන්න | මූල්‍ය අංශ ප්‍රධානී, ඒෂියන් හොටෙල්ස් ඇන්ඩ් දේපල |
| ජෙහානි කනගරාජ් | මූල්‍ය පාලක, සිලෝන් කෝල්ඩ් ස්ටෝර්ස් |
| තුෂාරි දිසානායක | ජ්‍යේෂ්ඨ කළමනාකරු ජීවිත මෙහෙයුම් යූනියන් ඇෂුවරන්ස් |
| නියෝමාල් පෙරේරා | ප්‍රධාන මෙහෙයුම් නිලධාරී - SAP විසඳුම් සහ සේවා, JKIT |
| ෂානේස් විජේසිංහ | AVP – සන්නම් නාම සහ තත්ත්ව සහතික , CHML |
| සුදර්ශනී බස්නායක | කළමනාකරු- සේවක කටයුතු /කාර්මික සම්බන්ධතා, JMSL |
| අනුශ්ක වීරරත්න | ප්‍රධාන විධායක නිලධාරි - ලංකා මරයින් සර්විසස් |
| ලොරෙයින් ලූක් | සහකාර කළමනාකරු, මානව සම්පත්, ජෝන් කීල්ස් දේපල |

# සමුහයේ පුවත්

සමුහයේ පුවත්

## කොළඹ වරාය බටහිර බහාලුම් පර්යන්තය






කොළඹ වරාය බටහිර බහාලුම් පර්යන්තය -1 හි සංවර්ධනය කිරීම සඳහා, ශ්‍රී ලංකා වරාය අධිකාරිය (SLPA) සහ කොළඹ බටහිර ජාත්‍යන්තර බහාලුම් පර්යන්තය (පුද්ගලික) අතර ගොඩනැගීම සහ අයිතිය පැවරීම (BOT) ගිවිසුම 2021 සැප්තැම්බර් 30 දින අත්සන් කරන ලදී.

## ජෝන් කීල්ස් ඔෆීස් ඔටෝමේෂන්



2021 ජුලි 21 වෙනි දා අන්තර් ක්‍රියාකාරී ස්මාර්ට්බෝඩ් දෙකක් සදහා දායක වෙමින් JKOA, ටෝකියෝ ඔලිම්පික් හී ශ්‍රී ලංකාවේ නිල විකාශන හවුල්කරු ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව සහ චැනල් අයි සමග හවුල්කාරිත්වයක් ඇති කර ගන්නා ලදි. මෙම ස්මාර්ට්බෝඩ්, තරගාවලියේ විශේෂ අවස්ථා වාර්තා කිරීමට සහ ඉදිරිපත් කිරීම සඳහා භාවිතා කරන ලදී. JKOA කණ්ඩායම මාධ්‍ය නිවේදකයින් සහ SLRC හී සේවක මණ්ඩලයට සම්පූර්ණ පුහුණුවක් සහ සහාය ලබා දෙන ලදි.






## යූනියන් ඇෂුවරන්ස්





ජීවිත රක්ෂණාහිමියන්ට සහ ඔවුන්ගේ ආදරණීයන් සදහා ජීවිත රක්ෂණාවරණයක් සමගින් සුවිශේෂී ආයෝජන අවස්ථාවක් ලබා දීම සදහා යූනියන් ඇෂුවරන්ස් 2021 ජුලි මස 15 වෙනි දා ඉන්වෙස්ට්මන් + දියත් කරන ලදි. රක්ෂණාවරණ කාලසීමාව අවසානයේ සහතිකකළ මුළු ප්‍රතිලාභයක් ලබා දෙන ඉන්වෙස්ට්මන් + ළමුන්ගේ අධ්‍යාපනය, නව ව්‍යාපාරයක් ආරම්භ කිරීම හෝ විශ්‍රාම අරමුදලක් වැනි කෙටි කාලීන මූල්‍ය අරමුණු සදහා කදිම ආයෝජන විසදුමක් වේ.



යූනියන් ඇෂුවරන්ස් පීඑල්සී 2021 ජුලි 02 වෙනි දා රක්ෂණ ක්ෂේත්‍රයේ පළමු ප්‍රතිලාභ සහ පිළිගැනීම් වැඩසටහන වන යූනියන් ඇෂුවරන්ස් ප්‍රිමියර් ක්ලබ් හඳුන්වාදෙන ලදි. මෙම වැඩසටහන නිර්මාණය කරන ලද්දේ විශිෂ්ට අලෙවි හැකියාවක් සහ පාරිභෝගික සේවාවක් නිරූපණය කරන සමාගමේ රක්ෂණ උපදේශකයින් පිළිගැනීමට ලක් කිරීම සදහා යි.




## ජෝන් කීල්ස් ප්‍රොපටීස්

සිනමන් ලයිෆ් හී මහල් 30 ක ඒ ශ්‍රේණියේ කාර්යයාල ගොඩනැගිල්ලේ 80% ප්‍රමාණයක් භාවිත කිරීම සදහා HCL ටෙක්නොලොජීස් 2021 අගෝස්තු 4 වෙනි දා ජෝන් කීල්ස් හෝල්ඩින්ග්ස් පීඑල්සී සමග ගිවිසුම් අත්සන් කරන ලදි. සිනමන් ලයිෆ්, කාර්යයාල ඉඩකඩ සදහා ප්‍රධාන පෙළේ බහුජාතික සමාගම් ආකර්ෂණය කර ගන්නා කොළඹ පිහිටි පළමු ඒ ශ්‍රේණියේ කාර්යයාල ගොඩනැගිල්ලට හිමිකම් කියයි.



ජෝන් කීල්ස් ප්‍රොපටීස්, සිනමන් ලයිෆ් හී 'The Suites' නේවාසික ඒකක එහි නව නේවාසිකයින් සදහා නිල වශයෙන් භාරදීම 2021 ජුලි 29 වෙනි දා ආරම්භ කරන ලදි. නිදන කාමර දෙකේ සිට හතර දක්වා නේවාසික ඒකකයන් 196 කින් සමන්විත මහල් නිවාස කුළුණේ ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කර භාරදීම කොළඹ ප්‍රමුඛතම ජල ආශ්‍රිත සංවර්ධන ව්‍යාපෘතියේ සාර්ථකත්වය නිරූපණය කරයි.

## සිනමන් බේ බේරුවල

බේරුවල සිනමන් බේ හෝටලය බේරුවල MOH/ PHI සහ කළුතර දිස්ත්‍රික්කයේ සෞඛ්‍යය නිලධාරීන් සමග එක්ව හෝටලයේ සේවකයින්ට සහ සිනමන් බෙන්තොට බීච්, සිනමන් සිටඩෙල්, සිනමන් හික්කා ට්‍රාන්ස් සහ සිනමන් වයිල්ඩ් යන හෝටලවල සේවකයින් සදහා 2021 ජුනි 22 සහ ජුලි 23 එන්නත්කරණ වැඩසටහනක් සංවිධානය කරන ලදි. බෙන්තොට සහ බේරුවල ප්‍රදේශයන්හී සිනමන් හෝටල්වල සේවකයින් සදහා කොවිඩ්-19 එන්නත් 500 ක් ලබා දෙන ලදි.




## සිනමන් දොන්වෙලි මාලදිවයින



ස්වාභාවික පරිසරය ආරක්ෂා කිරීමට සහය වෙමින් භාවිතය අවම කිරීම, ප්‍රතිභාවිතය සහ ප්‍රතිචක්‍රීයකරණය සදහා වූ පොරොන්දුව සංකේතවත් කරමින් සිනමන් දොන්වෙලි මාලදිවයින 2021 ජුලි 22 වෙනි දා රිසෝට් හෝටලයට වීදුරු ජල බෝතල් හඳුන්වාදෙන ලදි. මෙම ක්‍රියාකාරකම දියත් කරන ලද්දේ සිනමන් හෝටල් සහ රිසෝට්ස් එහි සියළුම හෝටල්වල ඒක - භාවිත ප්ලාස්ටික් පරිභෝජනය අඩුකිරීම සදහා දරන උත්සාහයේ එක් පියවරක් ලෙසිනි.




## සිනමන් බෙන්තොට බීච්

''අපගේ කාර්‍යභාරයට පමණක් සීමා නොවී අපගේ නිවස සුරැකීම අපගේ යුතුකම'' යන තේමාව යටතේ විධායකයින් දියත් කළ නව වැඩසටහනේ පළමු පියවර ලෙස ශ්‍රමදාන වැඩසටහනක් 2021 ජුලි 13 වෙනි දා සංවිධානය කරන ලදි.









2021 ජුලි 14 සහ 22 එන්නත්කරණ වැඩසටහනක් සංවිධානය කරන ලදි. අපගේ කණ්ඩායමේ සහාය ඇතිව බාහිර සේවකයින් ද ඇතුළුව සේවකයින්ගෙන් 92% සදහා කොවිඩ්-19 එන්නත ලබා දී ඇත.


## එලිෆන්ට් හවුස්

එලිෆන්ට් හවුස්, සීරෝට්‍රෑෂ් සමග එක්ව ජෝන් කීල්ස් සමූහ සමාජ ව්‍යවසායකත්ව ව්‍යාපෘතිය, සහ ප්ලාස්ටික්සයිකල් සහයෝගය ඇතිව ප්‍රතිචක්‍රීයකරණය සහ රටපුරා යහපත් ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණ භාවිතයන් ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව 2021 අගෝස්තු 11 වෙනි දා "සීරෝට්‍රෑෂ් ප්‍රතිචක්‍රීයකරණ ප්ලාස්ටික් එකතු කිරීමේ මධ්‍යස්ථානයක්" විවෘත කරන ලදි.







2021 සැප්තැම්බර් 01 වෙනි දා පැවති නිල හඳුන්වාදීමත් සමග ONE JKH දැක්ම ශක්තිමත් කිරීම සදහා පාරිභෝගික ආහාර අංශය, තම ක්ෂේත්‍රයට ගැලපෙන උපායමාර්ගික DE & I ක්‍රියාකාරකම් සහ ව්‍යාපෘතින් පෙළක් දියත් කරන ලදි. හඳුන්වාදීමට පෙර පැවති ක්‍රියාකාරකම් අතර 2021 අගෝස්තු 12 වෙනි දා නිෂ්පාදන සහ බෙදාහැරීම් ප්‍රමුඛ ආයතන DE & I ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන්නේ කෙසේ ද සහ හොඳ භාවිතයන් යන්ය පැහැදිලි කරමින් ජ්‍යේෂ්ඨ නායකත්ව කණ්ඩායම සදහා යුනිලීවර් ශ්‍රී ලංකා හී DE & I ප්‍රධානී නදීෂා විජේසිංහ විසින් මෙහෙයවන ලද දේශනය, ක්ෂේත්‍රයේ සියළුම ප්‍රධාන ඒකක නියෝජනය වන පරිදි සාමාජිකයින් 11 දෙනෙකුගෙන් යුත් අනුකමිටු පිහිටුවීම සහ 2021 අගෝස්තු 23 වෙනි දින සිට ක්ෂේත්‍රය තුළ දින 07ක් පුරා DE & I ටීසර් වැඩසටහනක් දියත් කිරීම යනාදිය ඇතුළත් විය.

## ආයතනික මධ්‍යස්ථානය




ශ්‍රී ලංකා සහ ඉන්දියා T20 තරගාවලියේ ජයග්‍රාහණය පුරෝකථනය කිරීමෙහිලා තරගයක් 2021 ජුලි 16 වෙනි දා සිට අගෝස්තු 3 වෙනි දා දක්වා ප්‍රධාන කාර්‍යාලය තුළ පැවැත්වුණි. ජෝන් කීල්ස් පර්යේෂණ හී සහන් මුණසිංහ ජයග්‍රාහණය කළ අතර ඔහුගේ නම මුද්‍රිත ශ්‍රී ලංකා ක්‍රිකට් ජර්සියක් ත්‍යාග වශයෙන් පිරිනමන ලදි.

සමුහයේ පුවත්


## සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනලස් (SAGT)

යගිරල වන රක්ෂිතය නැවත වගා කිරීම සඳහා වසර 03 ක හවුල්කාරිත්වයකට ඇතුළත් වෙමින් SAGT, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ තිරසාරත්ව මධ්‍යස්ථානය සමග 2021 අගෝස්තු මස 02 වෙනි දා අවබෝධතා ගිවිසුමකට අත්සන් තබන ලදි. 2019 වසරේ ආරම්භ කළ නැවත වන වගා කිරීමේ ව්‍යාපෘතිය හරහා විශ්වවිද්‍යාලය සමග මෙම සහයෝගීතාවය ආරම්භ වන ලදි.









2021 අගෝස්තු 26 සහ 27 දෙදින තුළ පර්යන්තය තුළ ක්‍රියාත්මක කළ මාර්ග අළුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතිය හරහා SAGT, එහි මෙහෙයුම් කටයුතු තිරසාර ව්‍යාපාර භාවිතයන්ට අනුකූලව සිදු කිරීමේ වෑයම තවදුරටත් තහවුරු කරන ලදි. මාර්ග අළුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකාව තුළ එක් වරක් පමණක් භාවිත කර ඉවතලන ප්ලාස්ටික් අපද්‍රව්‍ය මාර්ග ඉදිකිරීමේ කාර්මික අමුද්‍රව්‍යයක් බවට පත් කරමින් නිෂ්පාදනය කරන නව්‍ය නිමැයුමක් වන වෙනස් කරන ලද ප්ලාස්ටික් ඇස්ෆෝල්ට් කොන්ක්‍රීට් (PMAC) භාවිත කරයි. ඇස්ෆෝල්ට් මිශ්‍රණය හරිතාගාර වායු අවම කරමින් බිටුමන් පොසිල ඉන්ධන ප්‍රතිශතයකට ආදේශකයක් ලෙස ප්ලාස්ටික් අපද්‍රව්‍ය යොදා ගනී.

## ජේකේ පීඑල්සී








ශ්‍රී ලංකාවේ ප්ලාස්ටික් දූෂණය තුළින් වන බලපෑම අවම කිරීමේ පොදු අරමුණ ළඟා කර ගැනීම සඳහා ජෝන් කීල්ස් පීඑල්සී, ප්ලාස්ටික්සයිකල් සමග සම්බන්ධ වන ලදි. 'AGC ඉනොවේට්' වෙනස් කරන ලද ප්ලාස්ටික් ඇස්ෆෝල්ට් කොන්ක්‍රීට් (PMAC) භාවිත කර 2021 අගෝස්තු 02 වෙනි දා ජෝන් කීල්ස් පීඑල්සී එහි මුතුරාජවෙල පිහිටි ගබඩා පහසුකම සඳහා පිවිසෙන මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම නිමා කරන ලදි. PMAC යනු කසල ගොඩවල්වලින් ප්‍රතිචක්‍රීයකරණය කළ නොහැකි ප්ලාස්ටික් එකතු කර සකස් කරන ශක්තිමත් ඇස්ෆෝල්ට් මිශ්‍රණයක් වන අතර පාරවල් , මෝටර් රථ ගාලවල්, වාහන ගමන් මාර්ගයන් සහ වතු සඳහා පිවිසෙන මාර්ගයන් හී මතුපිට සැකසීම සඳහා යොදා ගනී.


## ජෝන් කීල්ස් ලොජිස්ටික්ස්

කණ්ඩායමේ සෞඛ්‍යය සහ ආරක්ෂාව සුරැකීම සඳහා කැපවෙමින් ජෝන් කීල්ස් ලොජිස්ටික්ස් 2021 අගෝස්තු 6-13 දක්වා බෙදාහැරීම් මධ්‍යස්ථානවලට සහ අගෝස්තු 31 වෙනි දා ප්‍රධාන කාර්යාලයට කොවිඩ්-19 වැළැක්වීමේ ක්‍රම පිළිබඳව දැනුවත් කිරීමේ සැසි පෙළක් සංවිධානය කරන ලදි. මෙම සැසි මගින් වෛරසය ව්‍යාප්ත වන ආකාරය, වෛරසය පැතිරීම වළක්වාලීම සඳහා ගතයුතු පියවර සහ කොවිඩ්-19 එන්නත්කරණය ලබා ගැනීමේ වැදගත්කම යනාදිය කෙරේ අවධානය යොමු කරවන ලදි.



## ප්ලස්ටික්සයිකල්









2021/22 සමූහයේ තිරසාර ශූරයින් සඳහා වූ සංසද දෙකෙන් පළමුවැන්න ප්ලස්ටිසයිකල් විසින් 2021 සැප්තැම්බර් 15 වන දා සංවිධානය කරන ලදී . මෙම සැසිය, සමූහයේ සමාගම් සහ ව්‍යාපාර ඒකක සඳහා ප්ලාස්ටික් දූෂණය අවම කිරීමට මෙන්ම අවම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග ඉදිරිපත් කිරීමට අවකාශයක් සලසන ලදී. හවුල් සමාගම් වන සවුත් ඒෂියන් ගේට්වේ ටර්මිනල්ස් සහ නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ තිරසාර අංශ කණ්ඩායම් නායකයින් ද මෙම සංසදය සඳහා සහභාගි විය.

## සිනමන් ග්‍රෑන්ඩ්







කොළඹ සිනමන් ග්‍රෑන්ඩ් 2021 සැප්තැම්බර් 14 වෙනි දා '2021 ජාත්‍යන්තර ගෘහ පාලකයින් අගය කිරීමේ සතිය' සමරන ලදි. සිනමන් ග්‍රෑන්ඩ් සහ සිනමන් ලේක්සයිඩ් හී සාමාන්‍යාධිකාරී කමල් මුණසිංහ මහතා ගෘහ පාලක සහ ලොන්ඩ්‍රි කණ්ඩායම අමතා ඔවුන්ගේ කැපවීම සහ දායකත්වය අගයන ලදි. ඇද සැකසීමේ තරගයක් ද සැප්තැම්බර් 17 වෙනි දා සංවිධානය කළ අතර ගෘහ පාලක, ඉදිරිපස කාර්යාල සහ ආරක්ෂක යන අංශවල සාමාජිකයින් 16 දෙනෙකු 2021 ශූරතාවය සදහා දැඩි තරගයක් ලබා දෙන ලදී.

## කීල්ස්

කීල්ස්, ලොව ප්‍රකට කෘතීම බුද්ධියෙන් බලගැන්වුණු සංවාද පහසුකම් සළසන 'Yellow.AI' ප්ලැට්ෆෝමය සමග හවුල්කාරිත්වයක් ඇති කර ගන්නා ලදි. මෙය රිටේල් සුපිරි වෙළෙඳසැල් දාමයක් සඳහා ශ්‍රී ලංකාවේ දියත් කළ පළමු වට්ස්ඇප් තහවුරුව ලබා ඇති චැට්බොට් වන අතර 2021 අගෝස්තු 27 වෙනිදා සමාජ ප්ලැට්ෆෝමය හරහා ජනතාවට හඳුන්වාදෙන ලදි.







වසංගත කාලය තුළ අපගේ කණ්ඩායමේ සෞඛ්‍යය සහ ආරක්ෂාව සඳහා අපි ප්‍රමුඛත්වය ලබා දෙන ලදි. සෑමවිටම අපගේ කණ්ඩායම් සාමාජිකයින්ගේ ආරක්ෂාව තහවුරු කරන ලද අතර කීල්ස් කණ්ඩායම සඳහාම වෙන් වුණු එන්නත්කරණ වැඩසටහනක් 2021 සැප්තැම්බර් 08 - 10 වෙනි දා දක්වා ෆෝර්බ්ස් රෝඩ් ප්‍රජා මධ්‍යස්ථානයේ දී මෙහෙයවන ලදි. මෙම දින 03 තුළ සේවකයින් 528 දෙනෙකු එන්නත්කරණය කළ අතර ඒ අනුව එන්නත්කරණය කළ මුළු සේවක සංඛ්‍යාව 78.6% විය.


## ජෝන් කීල්ස් IT




JKIT සහ නේෂන්ස් ට්‍රස්ට් බැංකුව (NTB) 2021 ජුලි 27 වෙනි දා FRIMI, මර්චන්ට්, ඉන්ටර්නෙට් බැංකින්, මොබයිල් බැංකින් සහ පරිපාලන පෝටලය යන ඩිජිටල් බැංකු භාවිතයන් සහයෝගීව නවීකරණය කිරීම සඳහා උපායමාර්ගික ගිවිසුමක් අත්සන් තබන ලදි. NTB සිය තාක්ෂණික හවුල්කරු ලෙස JKIT තෝරා ගනු ලැබුයේ සමාගම සතු විශිෂ්ට කාර්මික දැනුම සහ NTB පිළිබඳ අවබෝධය නිසයි. මෙම විසඳුම් නව්‍ය තාක්ෂණය භාවිත කොට DevOps සහ Agile Scrum ක්‍රමවේදයන් හරහා මයික්‍රොසර්විසස් නිර්මාණයන් මත ගොඩනගා ඇත.

## ඔක්ටේව්





ඔක්ටේව් විසින් සංවිධානය කළ 'OCTAVE INSIGHTS: Hear, Learn and Interact with Advanced Analytics Experts', දේශන මාලාවේ මෑත කාලීන දේශන දෙක වන 'Data Science in Football: from Hoax to Game Changer' සහ 'Making Boats Fly with AI' පිළිවෙලින් 2021 අගෝස්තු 06 වෙනි දා සහ 2021 අගෝස්තු 20 වෙනි දා මාර්ගගත ක්‍රමයට පවත්වන ලදි.

## ටී ස්මෝල්හොල්ඩර්ස් ෆැක්ටරීස් පීඑල්සී





2021 අගෝස්තු 25 වෙනි දා ටී ස්මෝල් හොල්ඩර්ස් ෆැක්ටරීස් සිය තේ කර්මාන්තශාලා 07 සේවකයින් 365 දෙනාම එන්නත්කරණය කර අවසන් කරන ලදි. මෙම කාර්යය පහසු වූයේ වෛරසය පැතිරීම වැළැක්වීමට සහ වසංගතය නිසා කර්මාන්තශාලාවල ක්‍රියාකාරිත්වයට බලපෑමක් ඇති නොවීමට ප්‍රදේශයේ MOH සහ PHI ලබා දුන් සහාය නිසා ය.

## සමුහයේ ශිෂ්‍යත්ව වැඩසටහන අගය කිරීමක්



1991 දී පිහිටුවන ලද, ජෝන් කීල්ස් විශ්ව විද්‍යාල ශිෂ්‍යත්ව වැඩසටහන මඟින්, විධායක නොවන සේවකයින්ගේ, උසස් අධ්‍යාපනය සඳහා දේශීය විශ්ව විද්‍යාල සඳහා තෝරා ගනු ලැබූ දරුවන් හට මූල්‍ය ආධාර සපයන ලදී . 1996 දී එවකට විටල් බුස්ටඩ් සමාගමේ සේවය කළ ජී.ආර් උඩුගම්පොල මහතාගේ පුත් රජිත් උඩුගම්පොල, ජෝන් කීල්ස් විශ්ව විද්‍යාල ශිෂ්‍යත්වය ලැබූ අයෙකි.



එම වසරේ ශිෂ්‍යත්ව පිරිනැමීම ඇතුළත් ජේකේ ටයිම්ස් කලාපය මෑතකදී හමුවීමත් සමඟ, දැන්, දකුණු ඕස්ට්‍රේලියාවේ ඇඩිලේඩ් ප්ලේන්ස් කවුන්සිලයේ මුදල් හා ව්‍යාපාර සම්බන්ධ සාමාන්‍යාධිකාරී ලෙස කටයුතු කරන රජිත්, සභාපතිතුමා වෙත ලිපියක් මඟින් තම කෘතඥතාවය පළ කරන ලදී. ඔහු සඳහන් කරනු ලැබුවේ, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් තම ව්‍යාපාර පරිපාලනවේදී උපාධියත්, ශ්‍රී ලංකා අලෙවි හා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ICASL)ඩිප්ලෝමාවත් සාර්ථකව නිම කිරීමට ජේකේඑච් විසින් ලබා දුන් මූල්‍ය ආධාර බෙහෙවින් ඉවහල් වූ බව ඔහු අනාවරණය කළේය. 2004 දී ඔහුගේ ශාස්ත්‍රීය ප්‍රශංසාව නිසා ඔහුට ගණකාධිකරණ ශාස්ත්‍රපති උපාධියක් සම්පූර්ණ කිරීමටත් ඉන් පසුව ඕස්ට්‍රේලියාවේ පදිංචි වීමටත් මාවත සැකසිණි.

වර්තමානයේදී, ඔහු මූලික වශයෙන් කවුන්සිලයේ මූල්‍ය සේවා දෙපාර්තමේන්තුවේ කළමනාකරණය පිළිබඳ වගකීම දරන අතර කවුන්සිලයේ මූලෝපායික මූල්‍ය, ප්‍රධාන හා සහනාධාර පරිපාලනය මෙන්ම ශ්‍රේණිගත කිරීම සහ දේපළ දත්ත සමුදාය නඩත්තු කිරීම අධීක්ෂණය කරයි.

රජිත්ට පෞද්ගලිකව ප්‍රතිචාර දක්වමින් සභාපතිතුමා අවධාරණය කළේ වසර ගණනාවක සිට ජෝන් කීල්ස් විශ්ව විද්‍යාල ශිෂ්‍යත්ව වැඩසටහන අපේ වටිනා සේවකයින්ට සහ පවුල්වලට අවශ්‍ය අවස්ථාවලදී උපකාර කිරීමට සමූහය කැපවූ බොහෝ ක්‍රම වලින් එකක් වූ බවත්, ජේකේඑච් විශ්ව විද්‍යාල ශිෂ්‍යත්ව වැඩසටහනෙන් අපේක්ෂිත ප්‍රතිඵලය සහ සාර්ථකත්වය පිළිබඳ රජිත්ගේ කතාව තුළින් සනාථ වන සඳහන් කරන ලදී.

